## සෙනසුරාදා

පළමුවන කියැවීම රෝම 16: 3-9, 16, 22-27

ශුද්ධ වූ පාවුළු තුමන් විසින් රෝමවරුන් වෙත යවන ලද හසුනෙන් කොටසකි.

සාම සිඹීමකින් එකිනෙකාට මාගේ ආචාරය පිරිනමන්න.

ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ තුළ මාගේ සහකාර සේවකයන් වූ, මා උදෙසා දිවි පිදීමට වුව ද කැමැත්ත පෙන් වූ ප්‍රිස්කාට ද, අකිලාට ද, මාගේ ආචාරය පිරිනමන්න. මා පමණක් නොව, සියලු විජාතික සභාවෝ ද ඔවුනට කෘතඥතාවය දක්වති. ඔවුන්ගේ නිවසේ රුස් වන සභාවටත් මාගේ ආචාරය පිරිනමන්න. ආසියාවෙන් ක්‍රිස්තුස් වහන්සේ වෙත මුලින් ම හැරුණු මාගේ කල්‍යාණ මිත්‍රයෙකු වූ එපිනතස්ට ද ඔබ උදෙසා අධික ලෙස වෙහෙස දැරූ මරියාට ද මාගේ ආචාරය පිරිනමන්න. මගේ ම රටවැසියන් වූ මා සමග සිරගත ව සිටි, අන්ද්‍රෝනිකස්ට හා ජූනියස්ට ද මාගේ ආචාරය පිරිනමන්න. අපෝස්තුළුවරුන් අතර කීර්තියක් දරන මොවුහු මට පළමුවෙන් කිතුණුවෝ වූහ. ස්වාමින් වන ක්‍රිස්තුස් වහන්සේ තුමාගේ හිත මිතුරු අම්ප්ලියාතුස්ට ද ක්‍රිස්තුස් වහන්සේ තුළ අපගේ සහකාර සේවකයෙකු වූ උර්බානස්ට ද මාගේ හිත මිතුරු ස්තාකිස්ට ද මාගේ ආචාරය පිරිනමන්න.

සාම සිඹීමකින් එකිනෙකාට මාගේ ආචාරය පිරිනමන්න. ක්‍රිස්තුස් වහන්සේගේ සියලු සභාවෝ ඔබට ආචාර කරති.

(මේ හසුන ලියන තිර්තියස් නම් මම, මාගේත් ආචාරය, ස්වාමින් වහන්සේගේ නාමයෙන් ඔබ වෙත මේ සමඟ එවමි.) මට ද මුළු සභාවට ද ආගන්තුක සත්කාරය කරන ගායස් ඔබ වෙත ඔහුගේ ආචාරය එවයි. නගර භාණ්ඩාගාරික තැන්පත් එරස්තස් ද සහෝදර ක්වරස් ද ඔබ වෙත ඔවුන්ගේ ආචාර එවති. අපගේ ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ වරප්‍රසාදය ඔබ සමග වේවා! ආමෙන්.

දෙවියන් වහන්සේට මහිමය වේවා! ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳ පණිවුඩය හා මා දේශනා කළ සුබ අස්න අනුව ද දීර්ඝ කල්පාන්තරයන්හි සැඟවී තිබී දැන් එළිදරව් කොට ඇති අභිරහස අනුව ද ඔබ ඇදහිල්ලෙහි ස්ථිර ලෙස පිහිටුවීමට උන්වහන්සේ පොහොසත් වන සේක. දැන් වනාහී ඒ අභිරහස දිවැසිවරයන්ගේ ලියැවිලිවලින් අනාවරණය කර ඇත. සියල්ලන් ම අදහා කීකරු වන පිණිස සදාතන දෙවියන් වහන්සේගේ ආඥාවෙන් එය සකල ජාතීන්ට ප්‍රකාශ කොට ඇත. සකල ප්‍රඥාවෙන් යුක්ත වූ අසමසම දෙවියන් වහන්සේට ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ කරණකොටගෙන සදහටම මහිමය වේවා! ආමෙන්.

දේව වචනය මෙසේ ය.

පිළිතුරු ගීය ගීතාවලිය 145: 2-5, 10-11

පිළිතුර : සමිඳුනි, සදාකල් ම අපි ඔබේ නම පසසමු.

ගීය : සැමදා ඔබට තුති පුදමි.
සදාකල් ඔබ නම පසසමි.
සමිඳාණෝ උතුම් ය. උසස් ම පැසසුම් ලැබිය යුතුය.
එතුමන්ගේ උතුම්කම සොයා දැනගත නොහැකි ය.

පරපුරෙන් පරපුරට ජනතාවෝ ඔබේ ක්‍රියා වර්ණනා කරති.
ඔබේ ප්‍රබල ක්‍රියා ගැන ප්‍රශංසා කරති.
මම ඔබේ රජ සිරි තෙද මහිමයත්,
ඔබේ අරුම පුදුම ක්‍රියාත් මෙනෙහි කරන්නෙමි.

සමිඳුනි, ඔබ මැවූ සියලු දේ ඔබ වහන්සේට තුති පුදයි.
ඔබේ සැදැහැවත්තු ද ඔබ වහන්සේට ප්‍රශංසා කරති.
ඔවුහු ඔබේ රාජ්‍යයේ මහිමය වර්ණනා කරති.
ඔබේ බල මහිමය ගැනද කතා කරති.

සුපුවත් ජය නද ක්‍රියා 16: 14

ආලේලූයා! ආලේලූයා!
ස්වාමිනි, ඔබ වහන්සේගේ පුත්‍රයාණන්ගේ වචනය පිළිගැනීමට
අප සිත් පැහැදුව මැනව.
ආලේලූයා!

නොහොත්

සුපුවත් ජය නද 2 කොරින්ති 8: 9

ආලේලූයා! ආලේලූයා!
ක්‍රිස්තුස් වහන්සේ ධනවත් ව සිටි නමුත්
අප ධනවත් කරන පිණිස අප උදෙසා දිළිඳු වූ සේක.
ආලේලූයා!

සුවිශේෂය ලූක් 16: 9–15

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

"ඔබ ලෞකික වස්තුව ගැන විශ්වාසී ව නොසිටියාහු නම්, වස්තුව ඔබට භාර දෙන්නේ කවරහු ද?"

"එබැවින් මම ඔබට කියමි. ලෞකික වස්තුවෙන් මිතුරන් සපයාගන්න. වස්තුව තිම ව ගිය කල ඔවුන් ඔබ සදාතන විමානවලට පිළිගනු ඇත. අල්ප දේ ගැන විශ්වාසී තැනැත්තේ මහත් දේ ගැනත් විශ්වාසී වෙයි. අල්ප දේ ගැන වංචනික තැනැත්තේ මහත් දේ ගැනත් වංචනික වෙයි. එබැවින් ඔබ ලෞකික වස්තුව ගැන විශ්වාස ව නොසිටියාහු නම් සැබෑ වස්තුව ඔබට බාර දෙන්නෝ කවුරු ද? අන් සතු දේ ගැන ඔබ විශ්වාසව නොසිටියාහු නම් ඔබට අයිති වන්න යන දේ ඔබට දෙන්නෝ කවුරුද? ස්වාමිවරුන් දෙදෙනෙකුට සේවය කරන්නට කිසි සේවකයෙකුට නුපුළුවන. මන්ද, ඔහු එක්කෙනෙකුට වෛර කරන්නේ ය, අනෙක් අයට ප්‍රේම කරන්නේ ය. නොහොත් එක් කෙනෙකුට ලැදි වන්නේ ය, අනික් අය හෙළා දකින්නේ ය. දෙවියන් වහන්සේටත්, වස්තුවටත්, සේවය කරන්ට ඔබට බැරිය."

පරිසිවරු ධනලෝභී අය වූ හෙයින් මෙවදන් අසා උන් වහන්සේට සරදම් කළහ. එවිට උන් වහන්සේ මෙසේ වදාළ සේක. "ඔබ නම් මිනිසුන් ඉදිරියෙහි ඔබගේ ම ධර්මිෂ්ඨකම ගැන පාරට්ටු කර ගන්නා අය ය. එහෙත් දෙවියන් වහන්සේ ඔබගේ සිත් දන්නා සේක. මනුෂ්‍යයන් විශිෂ්ඨ යයි සලකනු ලබන දෙය දෙවියන් වහන්සේ ඉදිරියෙහි පිළිකුලකි."

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.